විසර්ජන ශීර්ෂය - 178 - පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය

විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

---

1.1 <u>විගණන විෂය පථය</u>

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.

සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූනි 14 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 <u>ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම</u>

විසර්ජන ගිණම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් , රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

1.3 <u>විගණන නිරීක්ෂණ</u>

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා වූ ඡේදවල සඳහන් පධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) <u>ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම</u>

(i) අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>ලේඛන වර්ගය</u> | <u>අදාල රෙගුලාසිය</u> |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

(ආ) <u>විසර්ජන ගිණුම</u>

( i) <u>මුළු ප්‍රතිපාදනය හා වියදම</u>

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,785,791,900 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු. 1,090,965,626 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 694,826,274 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 39 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 563,690,000 | 567,606,000 | 31,144,893 | 5 |
| මූලධන | 1,200,100,000 | 1,218,185,900 | 663,681,381 | 54 |
| එකතුව | 1,763,790,000 | 1,785,791,900 | 694,826,274 | |

(ii) <u>අයවැය විචලනය</u>

වැය විෂයයන් 09ක සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 44 සිට සියයට 99 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම</u>

<u>පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්</u>

විෂය අංක 17801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු | රු | රු | රු | රු | රු |
| 1,500,000 | 1,456,400 | 300,000 | 1,103,810 | 3,800,000 | 3,735,803 |

(ඇ) <u>පොදු තැන්පත් ගිණුම</u>

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ වර්ෂයකට අඩු තැන්පතු ශේෂය රු. 925,404 ක් විය.

## 1.4 <u>යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය</u>

### 1.4.1 <u>වාර්ෂික කාර්ය සාධන වාර්තා</u>

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත අමාත්‍යාංශය විසින් පිළියල කල යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 ජූනි 21 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.4.2 <u>අභ්‍යන්තර විගණනය</u>

පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, පොල් පර්යේෂණ ආයතනය, හලාවත වැවිලි සමාගම හා කුරුණෑගල වැවිලි සමාගම ලෙස ව්‍යවස්ථාපිත මණ්ඩල තුනක් හා රාජ්‍ය සමාගම් දෙකක් ද අමාත්‍යාංශයේ හා අමාත්‍ය කාර්යාලයේද මදල් රෙගුලාසි 128 හි දක්වා ඇති රාජකාරි හා වගකීම් ඉටුකිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් මදල් රෙගුලාසි 133 ප්‍රකාරව පිහිටුවා ගත යුතු වුවත් අභ්‍යන්තර විගණන ඒකකයක් 2013 ජූනි 30 දක්වාත් ස්ථාපිත කර නොතිබුණි.

1.5 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති රෙගුලාසි වලට යොමුව | | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| 01 මුදල් රෙගුලාසි | | | |
| i. | මු.රෙ. 104 | 285,357 | අලාභහානි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් නිශ්චය කල යුතු වුවද 2012 වර්ෂයට අදාල වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි. |
| ii. | මු.රෙ. 104(2) | 258,456 | රු. 50,000 ට වැඩි අලාභහානි සම්බන්ධයෙන් වූ වාර්තාවේ පිටපතක් භාණ්ඩාගාරයට (භාණ්ඩාගාරයේ මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ) යැවිය යුතු නමුත් එකී නියමයන් අමාත්‍යාංශයේ වාහන අනතුරු සම්බන්ධයෙන් අනුගමනය කර නොතිබුණි. |
| iii. | මු.රෙ. 104(3)(4) | 285,357 | සිදු වී ඇති අලාභය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවේ හා අවසන් වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතු නමුත් |

| | | | |
|---|---|---|---|
| | | | සමාලෝචිත වර්ෂය තුල සිදු වූ වාහන අනතුරු 04 ක් එසේ වාර්තා කර නොතිබුණි. |
| iv. | මු.රෙ. 1645(අ) | 606,565 | අළුත්වැඩියා වියදම් ලොග් පොතෙහි සටහන් කර නොතිබුණි. |
| v. | මු.රෙ. 1646 | | ගමන් පිළිබද මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ ඒ ඒ මාසයේ ධාවන සටහන් ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| vi. | මු.රෙ. 1647(ආ) | | වාහන හා වාහනවලට සම්බන්ධ උපකරණ පිළිබඳ සමීක්ෂනයක් කර නොතිබුණි. |

02 <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 | මාස 6 ට වරක් වාහනවල ඉන්ධන පරිභෝජනය පරික්ෂා කල යුතු වුවත් අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් එවැනි පරික්ෂා කිරිමක් අමාත්‍යාංශය ආරම්භ කල දින සිට 2013 ජූනි 30 දින වන විටත් සිදු කර නොතිබුණි. |

1.6 <u>අනාර්ථික ගණුදෙණු</u>

(අ) මාසික විදුලි බිල්පත් වටිනාකම නියමිත කාලය තුල නොගෙවීම හේතුවෙන් , විදුලි බල මණ්ඩලය විසින් මාසික හිඟ ගෙවීම් මත රු. 19,383 ක දඩ මුදල් අයකර තිබුණි.

1.7 <u>කළමනාකරණ දුර්වලතා</u>

i. අමාත්‍යාංශ කාර්යාලය පවත්වාගෙන ගිය මහවැලි අධිකාරියට අයත් ගොඩනැගිල්ලේ වැඩි දියුණු කිරීම් හෝ වෙනත් කටයුත්තක් සිදුවන්නේ නම් එය සෑම විටම බදු දීමනාකාර පාර්ශවයේ ලිඛිත අනුමැතිය හා සුපරික්ෂාව යටතේ සිදුවිය යුතු බව බදු ගිවිසුමෙහි සඳහන් වුවත් රු. 9,030,595 ක අළුත්වැඩියාවන් සිදුකිරීමේ දී මහවැලි අධිකාරියේ කිසිදු ලිඛිත අනුමැතියක් හා සුපරික්ෂාවකින් තොරව සිදුවී තිබුණි.

ii. ස්ථාවර වත්කම් හා ගබඩා ලේඛණ නඩත්තු කිරීම

- අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනට සිදුකල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් ශේෂයන් ප්‍රධාන බඩු වට්ටෝරු පොතේ සඳහන් ශේෂයන් සමඟ නොසැසඳුනු අවස්ථා නිරීක්ෂණය විය.
- භාණ්ඩ එක් එක් අංශ වෙත නිකුත් කිරීමේදි සංකේතකරණයක් කර නොතිබුණි.
- භාණ්ඩ ලැබීමේදි හා නිකුත් කිරීමේදි ප්‍රධාන බඩු වට්ටෝරු පොතෙ යොමු සටහන යොදා නොතිබුණි.
- ප්‍රධාන වට්ටෝරු පොතේ හා එක් එක් අංශයන් මගින් නඩත්තු කරන ලද බඩු වට්ටෝරු පොත්වල භාණ්ඩවල විස්තර නිශ්චිතව හදුනාගත හැකි වන ලෙස විස්තරාත්මකව දක්වා නොතිබුණි.

iii. පොල් වතුවල ප්‍රගතිය විමර්ෂණය කිරීම සඳහා නිර්මාණය කරවා ගෙන තිබු ජාල ගත තොරතුරු පද්ධතිය

- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) අංක Re-Gov/MISC 2012 දරන 2012 අප්‍රේල් 30 දිනැති ලිපිය මගින් මෙම ජාල ගත තොරතුරු පද්ධතිය නිමවීමෙන් පසුව ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka Computer Emergency Team) ලවා මෙම පද්ධතියේ යොදා ඇති තොරතුරු ආරක්ෂණ උපයෝග පිලිබඳව විගණනයක් ඉටුකරවා ගත යුතු බව දක්වා තිබු නමුත් 2013 ජුනි 30 වන දින විටත් එවන් විගණනයක් ඉටුකරවා ගෙන නොතිබුණි.

iv. වැලිගම කොළ මැලවීමේ හා කොළ කුණුවීමේ රෝගය

- අමාත්‍යාංශය මගින් මාතර දිස්ත්‍රික් ලේකම් වෙත රු. මිලියන 170 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණු අතර, ඉන් දරන ලද වියදම් පිලිබඳ විස්තරාත්මක වාර්තාවක් අදාල වවුචර් පිටපත්ද සමඟ අමාත්‍යාංශයට එවිය යුතු වුවත් එම වාර්තා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

1.8 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිලිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| තෘතියික මට්ටම | 09 | 03 | 06 |
| ද්විතික මට්ටම | 768 | 230 | 538 |
| ප්‍රාථමික මට්ටම | 21 | 18 | 03 |
| වෙනත් | - | - | - |
| එකතුව | 804 | 256 | 548 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 548 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.